# බළන්ගොඩ නගර සභාව
## 2018-04-05 දින මහා සභාවේ රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2018.04.05**
**වේලාව - පෙ.ව. 10.30**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන**

2018 වර්ෂයේ අභිනවයෙන් පවත්වනු ලබන පළමු මහ සභා රැස්වීමට පැමිණි ගරු උප සභාපතිතුමන්, ගරු නාගරික මන්ත්‍රීවරුන්,ගරු නාගරික මන්ත්‍රීවරියන්,ලේකම්තුමිය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

මෙහිදී නිවේදන ආරම්භ කරමින් ගරු සභාපතිතුමා විසින් නගරයේ බදු ගෙවන ජනතාවගේ වටිනා ඡන්දයෙන් තේරිපත් වූ මහජන නියෝජිතයන් වශයෙන් නගරයේ ජනතාවට තෘප්තිමත් සේවාවක් සැලසිය යුතු බවත් තම තමන්ගේ පෞද්ගලික අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීමේ අරමුනින් වෛරය,

ක්‍රෝධය වපුරමින් මෙම සභාව දේශපාලන වේදිකාවක් කර නොගන්නා ලෙසත්,සභාවේ ගෞරවය රැකෙන පරිදි ක්‍රියා කිරීමට නිරන්තරයෙන් සිහියේ තබාගත යුතු බවටත් මෙහිදී සභාව දැනුවත් කරනලදී.

ලක්ෂ 4 ක මුදල් ප්‍රතිපාදන පුද්ගලික මන්ත්‍රී යෝජනා ලෙස ලබාදීමට කටයුතු කරන අතර නගර සභාව වෙත පළාත් පාලන අමාත්‍යාංශයෙන් නඩත්තු කටයුතු සඳහා ලැබී ඇති මිලියන 4ක මුදල නඩත්තු කටයුතු සඳහා යෙදවීමට අපේක්ෂා කරන බැවින් මන්ත්‍රිවරුන්ගේ වසම්වල සිදුකිරීමට ඇති නඩත්තු කටයුතුවල වාර්තාවක් ගරු සභාවට ලබාදෙන ලෙස දන්වීය.එමෙන්ම පළාත්පාලන ආයතනවල යටිතල පහසුකම් නගා සිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන - 2018 යටතේ රු.මිලියන 25 ක උපරිමයකට යටත්ව මුදලක් ලබාදීමට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් තීරණය කර ඇති බැවින් නගර සභාවේ ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස බලංගොඩ පොදු වෙළෙඳසැල ඉදිකිරීම සුදුසු බැවින් ඒ සඳහා අවශ්‍ය ඉතිරි මුදල දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත හැකි බවත් මෙහිදී ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙන ලදී.

**02. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම**
**ඉදිරිපත් වී නොතිබිනි.**

**03. කල්දී ඇති ප්‍රශ්න**

**03:01 කොම්පෝස්ට් ව්‍යාපෘතියේ නඩුව ඉවත් කිරීමට කටයුතු කිරීම - නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා**

2016 වර්ෂයේ නොවැම්බර් 09 වන දින ඇද හැලුණු ධාරානිපාත වර්ෂාව සමඟ බැංකියවත්ත කසල කළමණාකරණ මධ්‍යස්ථානයේ සනීපාරක්ෂක කසල රඳවනයේ ආරක්ෂිත බැම්ම හදිසියේ ගලවාගෙන යාම නිසා කසල ටොන් සිය ගණනක් ගොස් ඊට පහලින් තිබූ , දේපල කුඹුරු විනාශ වි තිබුණි. හානි වූ ප්‍රදේශය නැවත කසල ඉවත් කර පිරිසිදු කර යථා තත්වයට පත් කරන ලදි.

2016.11.29 දින ඉහත කී සිද්ධියම පාදක කර ගනිමින් කිසියම් පිරිසක් එක්ව බැංකියවත්ත කසල කළමණාකරන මධ්‍යස්ථානයට කසල රැගෙන යාමේ මාර්ගය අතර මඟදී අවහිර කරන ලදි.මෙම ක්‍රියාව හේතුවෙන් නගරයේ එකතු කරන ලද කසල ඝණ අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානය වෙතට සහ ගලි අපද්‍රව්‍යය ගලි ප්‍රතිකාරක පද්ධතියට ගෙනයාමට නොහැකිවිය. ඔවුන් සමඟ සාකච්ඡා කල අවස්ථාවේ ඔවුන් ප්‍රකාශ කර සිටියේ කිසිම ප්‍රතිසංස්කරණ කටයුත්තක් නොකරන ලෙසටත් ඝණ අපද්‍රව්‍ය කලමණාකරන මධ්‍යස්ථානය එම ස්ථානයෙන් ඉවත් කරන ලෙසටත්ය. එතෙක් ඔවුන් එම උද්ඝෝෂණය නතර නොකරන බවත් දැඩි ලෙසම දන්වන ලදි. එම හේතුව නිසාම නගරයේ පොදු වැසිකිලි සියල්ල පිරී පැවති බැවින් මහජන පරිහරණයට ලබාදිමට නොහැකි තත්ත්වයක් සහ නගරයේ එකතු වන කසල ඉවත් කිරිමට නොහැකි තත්වයක් උදාවූ බැවින් කැලි කසල එකතු කිරිම හා ප්‍රවාහනය කිරිමේ කටයුතු තාවකාලිකව නවතා දැම්මට සිදුවිය. මේ නිසා නගරයේ බදු ගෙවන ජනතාවද මහත් අපහසුතාවයකට ලක් විය.

මේ අතරතුර කාලයේ පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ කසල කළමණාකරණ මධ්‍යස්ථානයට දෛනිකව මාසයකට ආසන්න කාලයක් කසල හා ගලි අපද්‍රව්‍ය රැගෙන යාමට සිදු විය. මේ සඳහා රුපියල් ලක්ෂ 10 කට ආසන්න මුදලක් සභාවට දැරිමට සිදුවිය. අංක B 882 යටතේ බලංගොඩ පොලිස් ස්ථානය මගින් රාජකාරියට බාධා කිරීම සම්බන්ධව බැංකියවත්ත ගම්වාසීන්ට එරෙහිව ගොණු කරන ලද පැමිණිල්ල සමථ මණ්ඩලයට යොමුකරන ලද අතර එහිදී නගර සභා පාර්ශවය විසින් සියළුම නඩු සම්බන්ධයෙන් සමථයකට එළඹීමට එකඟ වූවද

ගම්වාසීන් එය ප්‍රතික්ෂේප කල අතර ඔවුන් විසින් සභාවට එරෙහිව ගොණුකරන ලද නඩුව ඉවත් කරගත නොහැකි බව ප්‍රකාශකර සිටින ලදී.

මෙලෙස බැංකියවත්ත කොම්පොස්ට් අංගනයේ ඇති වු හදිසි ආපදා තත්වය අවස්ථාවේදි ගම්වාසින් විසින් සභාව හා නිලධාරින් අපහසුතාවයට ලක් කරමින් නගරයේ සෞඛ්‍යයට තර්ජනයක් වෙමින් අශෝභන ලෙස ක්‍රියාකිරිම නිසා මෙම නඩුව ඉල්ලා අස්කර ගැනිමට නොහැකි බවත් නීති උපදෙස් ලබාගෙන ඉදිරියේදි ඒ පිළිබඳ සළකා බැලීමට කටයුතු යොදන බවත් ගරු සභාපතිතුමා විසින් සභාවට දනුම්දෙන ලදී.

**03፥02 ඇල්ලෙපොල කොට්ඨාශයේ ඩෙංගු පළවා හැරීමට කටයුතු කිරීම - නාගරික මන්ත්‍රී ඩබ්. ඩී. සුගත් ඉන්ද්‍රජිත් මැතිතුමා**

ඇල්ලෙපොල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරි ප්‍රමුඛව සිවිල් ආරක්ෂක බලකාය ඩෙංගු මර්දනය සඳහා නොදිරන බඳුන් එකතුකිරිම ,නිවාස පරීක්ෂාව සිදුකර ඇතිබවත්,පාර දෙපස අවිධිමත් ලෙස කසල බැහැර කරන මිනිසුන් පිලිබඳ පරිසර පොලිසියේද සහයෝගය ඇතිව විමර්ශනය සිදු කරන අතර,පාර දෙපස එකතු වූ කසල විධිමත් බැහැර කිරිමට කටයුතු කර ඇති බව පැවසූ ගරු සභාපතිතුමා 2018.04.03 දින සිට 2018.04.19 දක්වා පැවැත්වෙන ඩෙංගු සතියේදි ඇල්ලෙපොළ ග්‍රාම නිළධාරි වසම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු සංවිධානය කර ඇති බව සභාව වෙත දනුම්දෙන ලදී.

**03፥03 සී. සී. දෙමළ විද්‍යාලය මාර්ගයේ කාණු සෑදී ඇති ස්ථානවල ප්‍රිමික්ස් යොදා පිළිසකර කිරීම - නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

මෙය 2018 වර්ෂයේ නඩත්තු සැලැස්මේ ඇතුළත් කර ඇති බවත්,ඉදිරියේදි කඩිනමින් ඉටු කිරීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමා විසින් සභාව වෙත දනුම්දෙන ලදී.

**03፥04 සභාවට අයත් නිදහස් භූමියක වැසිකිළි පද්ධතියක් සකස් කිරීම - නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

සභාවෙන් සුදුසු භූමියක් හදුනාගෙන යෝජනා සම්මත කරගත් පසු වැඩ කටයුතු සිදුකල හැකි බව ගරු සභාපතිතුමා විසින් සභාව වෙත දනුම්දෙන ලදී

**03፥05 පැල්මඩුල්ල ගෙස්ට් පිවිසුම් අතුරු මාර්ගය අඩුපාඩු සකස් කර තාර දැම්ම - නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

මෙය 2018 වර්ෂයෙ නඩත්තු සැලැස්මේ ඇතුළත් කර ඇති බවත්,ඉදිරියේදි කඩිනමින් ඉටු කිරීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමා විසින් සභාව වෙත දනුම්දෙන ලදී.

**03፥06 නගරයේ පදික වෙළඳුන් නිසා අවහිර වී ඇති ස්ථාන පදිකයන්ට යාහැකි වන සේ නිදහස් කර දීම - නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

නගරයේ පදික වෙළඳුන් නිසා අවහිර වී ඇති ස්ථාන පදිකයන්ට යාහැකි වන සේ නිදහස් කර දීම සඳහා කරන ලද යෝජනාවට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා ඉදිරි දිනවලදී යෙදී ඇති අළුත් අවුරුදු උත්සවය නිසා පදික වෙළදාම් කටයුතු ඉහළ තත්වයක පවතින බැවින් සිංහල හින්දු අළුත් අවුරුද්ද අවසන් වූ වහාම ස්ථිර විසඳුමක් ගැනීමට කටයුතු ක්‍රියාත්මක කරන බව පවසා සිටින ලදී.

**03:07 නගරයේ කාණු පද්ධතියේ අපිරිසිදු හා අබලන් ස්ථාන පිළිසකර කිරීම - නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

2018 වර්ෂයේ සිංහල හින්දු අළුත් අවුරුද්ද අවසන් වූ වහාම නගරයේ ප්‍රධාන කාණු පවිත්‍ර කිරීමේ කටයුතු අදියර දෙකකින් ආරම්භ කිරීමට නියමිත බවත් එහිදී පළමු අදියර ලෙස නගරයේ මහ වීදිය ප්‍රධාන කාණු දෙපස හා දෙවන අදියර ලෙස නගරය වටා වසා ඇති කාණු පවිත්‍ර කිරීමට කටයුතු සංවිධානය කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් පවසා සිටින ලදී.

**04. කල් දී ඇති යෝජනා**

***04:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා***

කාරක සභා පත්කර ගැනීම

**04:01:01 මුදල් හා කර්මාන්ත කමිටුව පිහිටුවීම**

මුදල් හා කර්මාන්ත කමිටුව පත්කර ගැනීම සඳහා සාමාජිකයන් යෝජනා කරන ලෙස ගරු සභාපතිතුමා විසින් මෙහිදී සභාවට දැනුම් දෙන ලදී.එහිදී ගරු නාගරික මන්ත්‍රිනි එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය විසින් පහත නම් යෝජනා කරන ලදී.

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රිනි එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය
5. ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී. ගලප්පත්ති මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ප්‍රේමදාස මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී එම්.එම්.රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ප්‍රේමදාස මැතිතුමා විසින් තමාගේ නම මුදල් හා කර්මාන්ත කමිටුවෙන් ඉල්ලා අස්කර ගන්නා බව පවසා සිටියේය. මෙහිදී කමිටුවක් පිහිටුවීමේදි නියමිත සනපූරණයක් තිබේදැයි ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලදී.එහිදි නිළධාරින් විසින් කරුණු පැහැදිලි කිරීමෙන් පසුව නැවත ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී.

ඉන් අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් මුදල් හා කර්මාන්ත කමිටුව සඳහා එතුමාගේ නම යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ජ්.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා විසින් මුදල් කමිටු සාමාජිකයන් ලෙස ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමාගේ හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ජ්.ජේ.ප්‍රේමකුමාර මැතිතුමාගේ නම් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.නමුත් එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රිවරුන් දෙදෙනා විසින් ප්‍රතික්ෂේප කරන ලදුව **මුදල් හා කර්මාන්ත කමිටුව පිහිටුවීම පහත සාමාජිකයන්ගෙන් සිදුකිරිමට තීරණය කෙරිනි.**

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රිනි එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය
5. ගරු නාගරික මන්ත්‍රි එම්.එස්.පී. ගලප්පත්ති මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රි එම්.එම්.රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා

මෙම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:02 මුදල් කමිටුව සඳහා වියදම් දැරීමට බලය දීම හා උපරිම වියදම් සීමාව තීරණය කිරීම**

රු.10,000.00 සිට රු.500,000.00 දක්වා මුදල් වියදම් කිරීමේ බලය මුදල් කමිටුවට පැවරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් ස්ථිර කරන ලදි. සභාවේ කටයුතු අඛන්ඩව පවත්වාගෙන යාමටත් හදිසි වියදම් දැරීමටත් සිදුවන බැවින් එම කාර්යයන් වඩාත් පහසුකිරීම සඳහා මෙම යෝජනාව ගෙන එන බව ප්‍රකාශ කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සභාවේ කිසිවෙකුගේ අවශ්‍යතාවය පරිදි වියදම් කිරීමට බලය ලබාගත නොහැකි බවත්,මෙය පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ අනුමැතියට යටත්ව ලබාගත යුතු බවත් පවසා සිටින ලදී. එසේම චක්‍රලේඛවල හෝ ව්‍යවස්ථාවේ මේ පිළිබඳ සඳහන් වේ නම් එය සභාවට ඉදිරිපත් කරන ලෙසද පවසා සිටි අවස්ථාවේ ඊට පිළිතුරු ලබාදීම ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ යෝජනත්වයෙන් ගරු සභාපතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලදී.එහිදි නිළධාරින් විසින් කරුණු පැහැදිලි කිරීමෙන් පසුව නැවත ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී.

මෙහිදී තවදුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා සභාවේ වියදම් දැරීමේදි කිසිදු අනුමැතියක් නොමැතිව සිදුනොකරන බවත්,මෙතෙක් මෙම කටයුතු නිසියාකාරව සිදුකරගෙන පැමිණි ලේකම්තුමිය, ගණකාධිකාරිතුමා ඇතුළු පක්ෂ විපක්ෂ කණ්ඩායමකින් සැදුම්ලත් කමිටුවක් හරහා විනිවිද භාවයකින් යුතුව හා ව්‍යවස්ථානුකුලව සියළු වියදම් දැරීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.ගරු නාගරික මන්ත්‍රි ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් අදහස් දක්වමින් උපරිම සීමාව ලෙස පැවති රු.10,000 සීමාවෙන් ඔබ්බට යාම මෙතෙක් පැවති සම්ප්‍රදායට පටහැනි බවත්,සභාපතිගේ අභිමතය පරිදි එසේ වියදම් කිරීම

සඳහා ඉඩදිය නොහැකි බවත් බවසා සිටි අතර එම ප්‍රකාශය තහවුරු කරමින් ගරු නාගරික මන්ත්‍රි ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින්ද අදහස් ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා සභාවෙන් නැගුනු විරෝධය හේතුවෙන් මෙම යෝජනාව සම්මත කර ගැනිම සඳහා සභාවේ ඡන්දයක් පැවැත්වීමටත් යෝජනාවට පක්ෂ, විපක්ෂ ලෙස ඡන්දය ලබාදෙන ලෙසත් ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම්දෙන ලදී.මෙහිදී යෝජනාවට පක්ෂව, සභිකයන් අටදෙනෙක් ද, එනම්

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රිනි එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය
5. ගරු නාගරික මන්ත්‍රි එම්.එම්.රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය
8. ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය

මෙහිදී යෝජනාවට විපක්ෂව, සභිකයන් හත්දෙනෙක් ද එනම්,

1. ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රි ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රි ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රි එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රි ඩබ්.ඒ.නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රිනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය
7. ගරු නාගරික මන්ත්‍රි එම්.එස්.පී. ගලප්පත්ති මැතිතුමා

ඡන්දය ලබාදුන් අතර, ගරු නාගරික මන්ත්‍රි කේ.ජී. ප්‍රේමදාස මැතිතුමා ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැලකි සිටින ලදී. එමනිසා මෙම යෝජනාව සභාවේ **වැඩි ඡන්ද එකකින් සම්මත කරගන්නා ලදී.**

**04:01:03 මුදල් කමිටුවේ/සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සභාපතිට සභාවේ බලය පැවරීම හා වියදම් සීමාව තීරණය කිරීම**

සභාපතිවරයාට සභාවේ විධායක ක්‍රියා ඉටුකිරීමේ බලය පැවරීමටත්,සභාපතිවරයාට සභාවේ හා මුදල් කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව රු.500,000 දක්වා වියදම් කිරීමේ බලය ලබාදීම සඳහාත් ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු උපසභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:04 සෞඛ්‍ය , ඝන අපද්‍රව්‍ය හා පරිසර උපදේශන කළමනාකරණ කමිටුව පත් කිරීම**

ගරු සභාපතිතුමා පරිසර, සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව පත් කිරීම සඳහා කමිටු සාමාජිකයන් ලෙස

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රිනි එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය
5. ගරු නාගරික මන්ත්‍රී එම්.එම්.රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය
8. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා(ඉල්ලා අස්විය)

යන සභිකයන් පත් කිරීම සඳහා ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා විසින් කමිටුවට යෝජනා කිරීම පිළිබඳ ස්තුතිවන්ත වන බවත් කමිටුවෙන් නම ඉල්ලා අස්කර ගන්නා බවත් පවසා සිටින ලදී.අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමාගේ නම හැර ඉහත යෝජනා කරන ලද අනෙකුත් නම් සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:05 පුස්තකාල උපදේශන කමිටුව පත් කිරීම**

ගරු සභාපතිතුමා විසින් පුස්තකාල උපදේශන කමිටුව පත් කිරීම සඳහා කමිටු සාමාජිකයන් ලෙස

1. ගරු සභාපති චමික ජයමිණ විමලසේන මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ප්‍රේමදාස මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රිනි එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය
5. ගරු නාගරික මන්ත්‍රී එම්.එම්.රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය
8. ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය

යන සභික පිරිස සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.එම්.රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:06 රු.250,000.00 දක්වා කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම**

මෙම කමිටු සාමාජිකයන් පත්කිරීමට පෙර මේ පිළිබඳ පැහැදිලි කරගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලදී.එහිදි නිළධාරින් විසින් කරුණු පැහැදිලි කිරීමෙන් පසුව නැවත ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී.
එහිදී **රු.** 250,000.00 දක්වා කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව ලෙස ලේකම්, ගණකාධිකාරි,වැඩ අධිකාරි,මහජන සෞඛ්‍ය පරීක්ෂක,ප්‍රධාන කළමණාකරන සහකාර, යන නිළධාරින් සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:07 රු.500,000.00 දක්වා ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම**

රු. 500,000.00 දක්වා ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව අනුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාව ප්‍රසම්පාදන කමිටු සාමාජික ලෙස යෝජනා කල අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.එම්.රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය විසින් කමිටුවේ අනෙකුත් සාමාජිකයන් ලෙස ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා,ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ප්‍රේමදාස මැතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එහිදී, රු. 500,000.00 දක්වා ප්‍රසම්පාදන කමිටුව ලෙස,

ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ප්‍රේමදාස මැතිතුමාගෙන් සමන්විත වූ කමිටුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:08 සභාවේ ගෙවීම් සඳහා වියදම සහතික කිරීමට ගණකාධිකාරිවරයාට බලය පැවරීම**

මේ පිළිබඳ පැහැදිලි කරගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලදී.එහිදි නිළධාරින් විසින් කරුණු පැහැදිලි කිරීමෙන් පසුව නැවත ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන .එහිදී සභාවේ වියදම සහතික කිරීමට බලය ඇත්තේ ගණකාධිකාරිවරයාට බැවින් සභාවේ ගෙවීම් සඳහා වියදම සහතික කිරීමට ගණකාධිකාරිවරයාට බලය පැවරීම සඳහා ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:09 සභාවේ චෙක්පත් අත්සන් කිරීම සඳහා නිළධාරින්ට බලය පැවරීම.**

සභාවේ චෙක්පත් අත්සන් කිරීම සඳහා නිළධාරින්ට බලය පැවරීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ලේකම්, ගණකාධිකාරි ප්‍රධාන කළමණාකරන සහකාර, යන නිළධාරින් වෙත සභාවේ චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය පැවරීමේ යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:10 2018 වර්ෂයට අදාළව සභාව පවත්වන දින තීරණය කිරීම**

2018 වර්ෂයට අදාළව සභාව පවත්වන දින තීරණය කිරීමේදි පෙර පැවති පරිදිම සෑම මසකම අවසන් බ්‍රහස්පතින්දා දින සභාව පැවැත්වීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නාගරික

මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:11 අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස ආධාර ලබාදීම.**

සභාවේ සැම මන්ත්‍රීවරුන් සඳහාම සංවර්ධන කටයුතු වෙනුවෙන් ලක්ෂ 4 ක මුදල් ප්‍රතිපාදන ලැබෙන බවත් එම මුදල් තම කොට්ඨාශයේ අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස ආධාර ලබාදීමට හෝ කර්මාන්ත කටයුතු සඳහා යොදාගත හැකි බවත් පවසා සිටි ගරු සභාපතිතුමා අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස ආධාර ලබාදීමේදී අවශ්‍යතාවය මත පදනම් වූ ක්‍රමවේදයකට වැඩ අධිකාරි හා කාර්මික නිළධාරි අධීක්ෂණය යටතේ මුදල් කමිටුව දැනුවත් කරමින් මෙම කටයුතු සිදුකල යුතු බවත් පවසා සිටින ලදී.මේ සඳහා පුද්ගලික මන්ත්‍රී යෝජනා ලිඛිතව සභාවට ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:12 ඩබ්. ඒ. සචිනි මධුෂිකා මෙනවිය රු. 10,000.00 මාසික දීමනාව මත පෙර පාසල් පාලිකා තනතුරට බඳවා ගැනීම.**

ඩබ්. ඒ. සචිනි මධුෂිකා මෙනවිය රු. 10,000.00 මාසික දීමනාව මත පෙර පාසල් පාලිකා තනතුරට බඳවා ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය. එතුමා තවදුරටත් අදහස් දක්වමින් පෙර පාසල් පාලිකාවන් සඳහා මෙම දීමනාව ප්‍රමාණවත් නොවන බැවින් රු.15,000.00 දක්වා වැඩිකර දෙන මෙන් ආණ්ඩුකාරවරයාගෙන් ඉල්ලීමක් කරන ලෙසද මෙහිදී වැඩිදුරටත් යෝජනා කරන ලදී.

**04:01:13 කේ. පී. ජීවන්ති මධුෂානිකා මෙනවිය ආයුර්වේදයේ කම්කරු තනතුර සඳහා දෛනික පදනම මත බඳවා ගැනීම**

ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව සඳහා අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා කම්කරු තනතුරු පිළිබඳ ඇති පුරප්පාඩු පිළිබඳවත්, ආයුර්වේද කම්කරු තනතුරක පුරප්පාඩු තිබේද යන්නත්, පෙර පාසල් පාලිකාවන් මෙසේ දෛනික පදනම මත බඳවා ගැනීමේ හැකියාවක් නොපවතීද යන්නත් පිළිබඳ විමසා සිටින ලදී. මෙයට පිළිතුරු දීම සඳහා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ යෝජනත්වයෙන් ගරු සභාපතතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලදී.එහිදි නිළධාරින් විසින් කරුණු පැහැදිලි කිරීමෙන් පසුව නැවත ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරනලදී.
මේ අනුව ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:14 226-7521 අංක දරණ නගර සභාවට අයත් ටිපර් රථය අළුත්වැඩියා කිරීම**

226-7521 අංක දරණ නගර සභාවට අයත් ටිපර් රථයේ එන්ජින් හා ඩිපරන්සල් යන කොටස් අළුත්වැඩියා කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු

උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:01:15 මාර්ග නඩත්තු වැඩසටහන් සැලැස්ම - 2018 දෙවන කාර්තුවේ සිට අනුමත කිරීම**

මාර්ග නඩත්තු වැඩසටහන් සැලැස්ම - 2018 දෙවන කාර්තුවේ සිට අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

***04:02 ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා***

04:02:01 ගොරොක්ගහමඩ කිරිමණ්ඩලය අසළ මාර්ගය අඩි 200ක් කොන්ක්‍රීට් කර නිම කිරීම

04:02:02 මිරිස්වත්ත විලියම් මාවත පහළ කොටස ජලය බැසයාම සඳහා කාණු පද්ධතිය සංවර්ධනය කිරීම

04:02:03 දෙහිගස්තලාව ඒ. කේ. නසීර් මහතාගේ නිවස අසළ මාර්ගය අඩි 200ක් කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම

04:02:04 බළන්ගොඩ එෆ්. එච්. මාවත ජල ටැංකිය පහළ කොටස මුජා මහතාගේ නිවසට යන මාර්ගය JCB යන්ත්‍රය භාවිතා කර සංවර්ධනය කිරීම

04:02:05 බලගහමුල කහටගහවත්ත මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම

04:02:06 කහටපිටිය පාර හා දෙහිගස්තලාවට අළුතෙන් වීථි ලාම්පු 07 ක් සවිකිරීම

ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා 6 ඉතා කඩිනමින් ඉටුකර දෙන මෙන් මෙහිදී ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව සභාවේ ඒකමතිකව සම්මත විය.

***04:03 ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය***

04:03:01 කිරිඳිගල දුම් පරීක්ෂණ ස්ථානය අසළ පිලිසියස් මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම

04:03:02 අනඳමෙත්ගම තුන්වන පටුමග බෝක්කුව දමා කාණු පද්ධතිය සංවර්ධනය කිරීම

04:03:03 මුගුණමලේ සුසාන භූමියට යන මාර්ගය සංවර්ධනය කිරීම

04:03:04 ශෛලතලාරාම විහාරාස්ථානයට පානීය ජලය ලබාදීම

ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අතරින් ශෛලතලාරාම විහාරාස්ථානයට පානීය ජලය ලබාදීමේ යෝජනාවට ප්‍රමුත්වය ලබාදෙමින් අනෙකුත් යෝජනාද ඉටුකර දෙන මෙන් ඉල්ලා සිටින ලදී. මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව සභාවේ ඒකමතිකව සම්මත විය.

***04:04 ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා***

04:04:01 මිරිස්වත්ත සුහයිර් අලි මාවතේ දෙවන පටුමග අවසන් අදියර සම්පූර්ණ කිරීම

04:04:02 දෙහිගස්තලාව මහවත්ත මාර්ගය පළවන පටුමග සංවර්ධනය කිරීම

04:04:03 දෙහිගස්තලාව කල්තොට මාර්ගයේ තුන්වන පටුමග ඉම්රාන් මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම

04:04:04 මිරිස්වත්ත මුස්තාෆා මාවත කාණු පද්ධතිය සකස් කිරීම

04:04:05 අක්කර 18 රූපා මියගේ නිවස අසලින් යන මාවත සංවර්ධනය කිරීම

04:04:06 ෆලීල් හාජියාර් මාවත පළවන පටුමග නලින් මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම

04:04:07 බළන්ගොඩ නගර සභාවට අයත් සාප්පු කඩ කාමර හා නව බස්නැවතුම්පළ කඩකාමරවල හිඟකුලී මුදල ඉවත් කිරීම

04:04:08 නිවාස ආධාර ලබාදීම

මෙහිදී ඉදිරිපත්කරන ලද යෝජනා අතරින් නිවාස ආධාර ලබාදීමේ යෝජනාවට ප්‍රමුඛතාවය ලබාදෙන ලෙස පවසා සිටි ගරු උප සභාපතිතුමා දෙහිගස්තලාව වසමේ අඩු ආදායම්ලාභීන්ට රු.50,000 මුදල් ප්‍රතිපාදන යටතේ ආධාර ලබා දීමට අපේක්ෂා කරන බව පවසා සිටින ලදී.

තවදුරටත් අදහස් දක්වමින් බළන්ගොඩ වෙළෙඳ ප්‍රජාවගේ සුරක්ෂිතතාව තහවුරු කිරීම උදෙසා නගර සභා පනතින් ලැබී ඇති බලතල අනුව බළන්ගොඩ නගර සභාවට අයත් සාප්පු කඩ කාමර හා නව බස්නැවතුම්පළ කඩකාමරවල හිඟකුලී මුදල ඉවත් කිරීම හෝ අඩක් කපාහැරීම සිදුකරන ලෙසත් සභාවේ වැඩි සභිකයන් පිරිසකගේ කැමැත්ත අනුව කඩකුලී නැවත සංශෝධනය කර අනුමැතිය සඳහා පළාත් සභාව වෙත යැවීම සිදුකරන ලෙසත් මෙහිදී ගරු උප සභාපතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මෙම යෝජනාව සඳහා එකගත්වය පළකරමින් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් කඩ කුළිය වැඩිවිය යුතු බවත් නමුත් එය සිදුවිය යුත්තේ සාධාරණ පරිදි බවත්,මේ පිළිබඳ නැවත තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා සාධාරණයක් කරන මෙන් හෝ වෙළෙඳ ප්‍රජාව කැදවා තීරණයක් ගෙන ආණ්ඩුකාරවරයා දැනුවත් කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.එස්.පී. ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් මෙම කඩකුලිය වැඩිකිරීමේදී විශාල අසාධාරණයක් සිදු වී තිබෙන බැවින් අදාළ කුළී මුදල් අඩුකර හැකි උපරිම සහනයක් අපේක්ෂාවෙන් සිටින වෙළඳුන් සඳහා නිසි පිළිතුරක් ලබාදෙන මෙන් ඉල්ලා සිටින ලදී. මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා නගර සභා ආඥා පනතේ 244 වගන්තිය අනුව මෙම කුළිය ප්‍රතිසංශෝධනය කිරීම සභාවට සිදුකල හැකි බවත් 1970 වර්ෂයේ සිට නිසිපරිදි කඩකුළි ගෙවන ලද මෙම වෙළඳුන්ට අසාධාරණයක් නොකර ,සභාවේ බලතල අනුව 10%න් පමණ කඩකුළිය වැඩිකර ඔවුන්ට සාධාරණයක් සිදුකරන මෙන් ඉල්ලා සිටින ලදී.ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින්ද මෙම අදහස් ස්ථිර කරමින් අදහස් පවසා සිටින ලදී.

රටේ පවතින ආර්ථික තත්වයත් සමගම 300% පමණ කුළිය වැඩිවීම අසාධාරණ බව පෙනීයන බව පැවසූ ගරු නාගරික මන්ත්‍රි කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා සභාවේ සියල්ල ඒකමතිකව සම්මත කරගෙන යම් සහනයක් ලබාදීමට ක්‍රියාකරමු යන්න පවසා සිටින ලදී.

මෙහිදී හිඟ මුදල් කපාහැරීමෙන් අනතුරුව කඩකුළිය 10%න් පමණ වැඩිකර සහනයක් ලබාදීම සුදුසු බව පවසා සිටි ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා මේ පිළිබඳ පැහැදිලි කර ගැනීම සඳහා එතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලදී . නිළධාරින් විසින් කරුණු පැහැදිලි කර දීමෙන් අනතුරුව නැවත ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරනලදී
මෙහිදී නිළධාරින් විසින් පැහැදිලි කරදුන් කරුණු පදනම් කරගෙන ගරු සභාපතිතුමා විසින් අදහස් දක්වමින්, තක්සේරු දෙපාර්තමේන්තුව මගින් දෙවරක් තක්සේරු කිරීම සිදුකර ඇති බවත්, ඒ කිසිදු අවස්ථාවක තක්සේරුව ක්‍රියාත්මක නොවූ බැවින් විශාල මුදලක් වැඩිවීමක් ලෙස පෙනෙන බවත් පවසා සිටින ලදී.තක්සේරුව අභියෝගයට ලක්කිරීමට හැකියාවක් නොමැති හෙයින් මහ නගර සභා ආඥා පනතේ 266 වගන්තිය අනුව රු.1000.00 ඉක්මවූ සෑම මුදලක්ම කපාහැරීමට හෝ අඩුකිරීම සඳහා මහ ඇමතිතුමාගේ අනුමැතියට යටත්ව සිදු කිරීමට සභාවට තීන්දු තීරණ ගත හැකි බවත් පැහැදිලි කරන ලදී.

මෙහිදී සිදුකරන දීර්ඝ සාකාච්ඡාවෙන් අනතුරුව අයකර ගැනීමට නොහැකි වූ හිඟය කපා හැරීමටත් තක්සේරුව ක්‍රියාත්මක නොකල වර්ෂයේ සිට මේ දක්වා කුළිය 10% න් වැඩිකිරීම සුදුසු බවත් සභාවේ අවසන් තීරණය විය.මෙම තීරණය ගරු සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

***04ඃ05 ගරු නාගරික මන්ත්‍රිනි එම්. සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය***

04ඃ05ඃ01 උඩකන්ද මාර්ගයේ උඩකන්ද අතුරු මාර්ගය පිළිසකර කර ගැනීම

04ඃ05ඃ02 මහමෙව්නාව මාර්ගය කාණු පද්ධතිය සකස් කරගැනීම

04ඃ05ඃ03 කරව්කැටිය කොටුගොඩැල්ල මාර්ගයේ කාණු පද්ධතිය සකස් කරගැනීම

ගරු නාගරික මන්ත්‍රිනි එම්. සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ඉතා කඩිනමින් ඉටුකර දෙන ලෙසත් එහිදී උඩකන්ද මාර්ගයේ උඩකන්ද අතුරු මාර්ගය පිළිසකර කර ගැනීම සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන ලෙසත් මෙහිදී ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතිකව සම්මත විය.

***04ඃ06 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා***

04ඃ06ඃ01 ඇල්ලෙඅරාව සමගි මාවතේ නළ ළිඳක් ඉදිකර ජලය ලබාදීම

04ඃ06ඃ02 ඕළුගංතොට ගංගාරාමය පන්සල අසලින් ඇති මාර්ගය චමින්ද මහතාගේ නිවස දක්වා සංවර්ධනය කිරීම

04:06:03 ජනපද මාර්ගයේ කාණු පද්ධතිය පිළිසකර කිරීම

04:06:04 සෙලෝවත්ත මාර්ගය සංවර්ධනය කිරීම

04:06:05 නාගරික ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ඒ සඳහා ප්‍රමුඛ ස්ථාන හඳුනාගෙන ජල අවශ්‍යතා ලබාදීම සඳහා කඩිනමින් පියවර ගැනීම

04:06:06 පුරණෙගෙදර මාර්ගයේ අවසාන කොටස පැතිබැම්ම යොදා සංවර්ධනය කිරීම

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අතරින් ඇල්ලෙඅරාව සමගි මාවතේ නළ ළිඳක් ඉදිකර ජලය ලබාදීම හා ඕළුගංතොට ගංගාරාමය පන්සල අසලින් ඇති මාර්ගය චමින්ද මහතාගේ නිවස දක්වා සංවර්ධනය කිරීම යන යෝජනා 2 ඉතා කඩිනමින් ඉටුකර දෙන මෙන් මෙහිදී ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.මෙම යෝජනා සියල්ල ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතිකව සම්මත විය.

### *04:07 ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඩී. සුගත් ඉන්ද්‍රජිත් මැතිතුමා*

04:07:01 ඇල්ලෙපොල කොට්ඨාශය තුළ සියලු අතුරු මාර්ග, කාණු පද්ධති ඉදිකිරීම, සංවර්ධනය හා වීථි ලාම්පු ස්ථාපනය කිරීම

04:07:02 බළන්ගොඩ නගර සභාවට අනුබද්ධිත ශාඛා පුස්තකාලයක් ඇති කිරීම

04:07:03 ඇල්ලෙපොල වසමේ පොදු සුසාන භූමිය තුළ ගොඩනැගිල්ලක් ඉදිකිරීම, ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම හා තලංගම පොදු සුසාන භූමියේ නව ගොඩනැල්ලක් ඉදිකිරීම

04:07:04 ඇල්ලෙපොල වසම සඳහා ප්‍රජා ශාලාවක් ඉදිකර මාතෘ සායන වැනි පොදු අවශ්‍යතා සඳහා පහසුකම් ලබාදීම

04:07:05 තලංගම වසමේ අඩක් නිමකළ ප්‍රජා ශාලාවේ වැඩ අවසන් කිරීම

04:07:06 ඇල්ලෙපොල කොට්ඨාශයේ ප්‍රධාන මාර්ගය ආශ්‍රිත බස්නැවතුම් පොළවල් සඳහා ආවරණ කුටි ඉදිකිරීම

04:07:07 ජලය හා විදුලිය නොමැති අඩු ආදායම්ලාභීන් සඳහා එම පහසුකම් ලබාදීම

මෙහිදි මෙම යෝජනා ගරු සභාව වෙත ඉදිරිපත්කල ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් අදහස් දක්වමින් ඩබ්.ඩී.සුගත් ඉන්ද්‍රජිත් මැතිතුමා ජීවතුන් අතර නොමැති වුවත් ඔහුට දක්වන ගෞරවයක් වශයෙන් එතුමා විසින් කරන ලද යෝජනා අතරින් ඇල්ලෙපොල වසමේ පොදු සුසාන භූමි ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම හා ඇල්ලෙපොල කොට්ඨාශයේ ප්‍රධාන මාර්ගය ආශ්‍රිත බස්නැවතුම් පොළවල් සඳහා ආවරණ කුටි ඉදිකර එතුමා නමින් නම් කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතිකව සම්මත විය.

### *04:08 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා*

04:08:01 සියඹලාගහවත්ත පන්සල පහළ මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම

04:08:02 ජනපද මාර්ගයේ විධිමත් ලෙස ජලය බැසයාම සඳහා බෝක්කු යොදා කාණු පද්ධතිය සකස් කිරීම

04:08:03 ඕළුගංතොට සෙලෝවත්ත මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම

04:08:04 සුදර්ශනගම යෝජිත ප්‍රජාශාලාව ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබාගැනීම

04:08:05 හුණුකුඹුර ගාලවත්ත මාර්ගය සංවර්ධනය කිරීම

04:08:06 කෝපිවත්ත සිට සුදර්ශනගමට ඇති මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අතරින් ජනපද මාර්ගයේ විධිමත් ලෙස ජලය බැසයාම සඳහා බෝක්කු යොදා කාණු පද්ධතිය සකස් කිරීම යෝජනාවට මූලිකත්වය ලබාදෙමින් සුදර්ශනගම යෝජිත ප්‍රජාශාලාව ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබාගැනීම සඳහා කටයුතු සිදුකර දෙන ලෙසත් ඒ සඳහා ගල්වලේ ගුණදාස මහතා විසින් ඉඩමක් ලබාදීමට සූදානම් බවත් පවසා සිටි අතර මෙම යෝජනා කඩිනමින් ඉටුකර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

### *04:09 ගරු නාගරික මන්ත්‍රී කේ. පී. ප්‍රේමදාස මැතිතුමා*

04:09:01 බළන්ගොඩ ජාතික පාසල පිටුපසින් ආරම්භ ව ධර්මානන්ද පිරිවෙන දක්වා ඇති පාසැල් වටරවුම් මාවත සංවර්ධනය නොකළ කොටස් කොන්ක්‍රීට් හෝ සිමෙන්ති ගල් අතුරා සංවර්ධනය කිරීම

04:09:02 උඩඇල්ලෙපොල ගල්පොත්ත ප්‍රදේශයට පිවිසුම් මාර්ගයේ වේ ගඟ හරහා අඩි 05 ක් පළලින් යුතුව අත්වැල් පාලමක් ඉදිකිරීම

ගරු නාගරික මන්ත්‍රී කේ. පී. ප්‍රේමදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා දේශපාලනික පොරොන්දු නොවන බවත් ඉතා අත්‍යවශ්‍යයෙන් සිදුවිය යුතු යෝජනා බැවින් කඩිනමින් ඉටුකර දෙන ලෙසත් මෙහිදී ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.මෙම යෝජනා 2 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

### *04:10 ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා*

04:10:01 කිරිඳිගල ශෛලතලාරාමය, මුගුණමලේ, ඉත්තගලහේන, දොරවෙළ යන ප්‍රදේශ සඳහා පානීය ජලය ලබාදීම කඩිනම් කිරීම

04:10:02 ඉත්තගලහේන ගම්මානයේ සිට ශෛලතලාරාමය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම හා පියගැටපෙළක් ඉදිකිරීම

04:10:03 මුගුණමලේ සුසාන භූමිය මාර්ගය සංවර්ධනය කිරීම

04:10:04 මුගුණමලේ ගලපල්ල අරාව මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරීම

04:10:05 මුගුණමලේ සුනිල් ශාන්ත මහතාගේ නිවස ඇතුළු නිවාස සඳහා යන මාර්ගය සංවර්ධනය කිරීම

04:10:06 මුගුණමලේ පොල්වත්ත මාර්ගය සංවර්ධනය කිරීම

04:10:07 දොරවෙල ගම්මානයේ ඉහළ කොටස මාර්ගය පැතිබැම් සහ පියගැට පෙළ යොදා සංවර්ධනය කිරීම

04:10:08 කිරිදිගල වැලිහරනාව වටරවුම් මාර්ගය කාණු යොදා සංවර්ධනය කිරීම

04:10:09 කිරිදිගල තොසිල ගාඩ්න් ගම්මානයේ මාර්ග සංවර්ධනය කිරීම

04:10:10 කිරිදිගල තොසිල ගාඩ්න් ගම්මානයට තෙකළා විදුලිය ලබාදීම

04:10:11 කිරිදිගල දේගපිටිය මාර්ගය සංවර්ධනය කිරීම

04:10:12 මහකුඹුර මාර්ගය සංවර්ධනය කිරීම

04:10:13 කිරිදිගල මැදපාර අවසාන කොටස පැතිකාණු යොදා සංවර්ධනය කිරීම

04:10:14 කිරිදිගල මැදපාර සිට දෙල්ගොඩ මහතාගේ නිවස ඇතුළු නිවාස සඳහා යන මාර්ගය සංවර්ධනය කිරීම

04:10:15 කිරිදිගල අනඳමෙත්ගම අතුරු මාර්ගය තුන්වන පටුමග සංවර්ධනය කිරීම

04:10:16 කිරිදිගල අනඳමෙත්ගම සිට ඩී. මාලනී මහත්මියගේ නිවස ඇතුළු නිවාස සඳහා යන මාර්ගය සංවර්ධනය කිරීම

04:10:17 කිරිදිගල ජල සම්පාදන කාර්යාලය අසල සිට ඇති පළමුවන පටුමග හා දෙවන පටුමග සංවර්ධනය කිරීම

04:10:18 කිරිදිගල සියඹලාගහවත්ත මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරීම

04:10:19 කිරිදිගල ප්‍රාර්ථනා බෝධිය අසළට කසළ වර්ගීකරණය කිරීමේ බඳුන් ලබාදීම

04:10:20 බළන්ගොඩ නගර සභා සීමාව තුළ විශ්ව විද්‍යාල සඳහා තේරීපත්වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ලබාදුන් ශිෂ්‍යාධාර යළි ලබාදීම

ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අතරින් කිරිදිගල ශෛලතලාරාමය, මුගුණමලේ, ඉත්තගලහේන, දොරවෙළ යන ප්‍රදේශ සඳහා පානිය ජලය ලබාදීම කඩිනම් කිරීම යෝජනාව සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන ලෙසත් මන්ත්‍රී ප්‍රතිපාදන යොදවා මුගුණමලේ සුසාන භූමිය මාර්ගය සංවර්ධනය කිරීම හා කිරිදිගල තොසිල ගාඩ්න් ගම්මානයේ මාර්ග සංවර්ධනය කිරීම යන යෝජනා සඳහා මූලිකත්වය ලබාදෙමින් ඉටුකර දෙන ලෙසත් ඉල්ලාසිටින ලදී. මෙම යෝජනා ගරු ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

## *04:11 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පති මැතිතුමා*

04:11:01 කරව්කැටිය මාර්ගයේ එක් පැත්තකට හෝ කාණුව වැසෙන සේ කොන්ක්‍රීට් ආවරණය දැමීම

04:11:02 නාගරික ළමා උද්‍යානයේ සිට ලංකාබැංකුව අසලට ගඟ දිගේ ඉඩ ඇති බැවින් ඇව්දින මංතීරුවක් සකස් කිරීම

04:11:03 කාර් පාර්ක් බිම තාර හෝ කාපට් අතුරා සංවර්ධනය කිරීම

04:11:04 ළදරු උයන අසළ රථගාලක් සකස් කිරීම

04:11:05 නාගරික ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම

04:11:06 ලංකා බැංකුව අසලින් ඇති මාර්ගයේ සිට මෝහාන් සාලිය එල්ලාවල මාර්ගය වෙත පයින් ගමන් කිරීමට ලෑලි පාලමක් තනාදීම

04:11:07 ඔරලෝසු කණුව අසල දිසා පුවරු සවි කිරීම

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අතරින් කරවිකැටිය මාර්ගයේ එක් පැත්තකට හෝ කාණුව වැසෙන සේ කොන්ක්‍රීට් ආවරණය දැමීම යන යෝජනාව සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන ලෙසත් ඔරලෝසු කණුව අසල දිසා පුවරු සවි කිරීම ඉතා අත්‍යවශ්‍ය කාරණාවක් වී ඇති බැවින් එම යෝජනාවද කඩිනමින් ඉටුකර දෙන ලෙසත් ඒ සඳහා අනුග්‍රාහකයකුගේ සහය අවශ්‍ය නම් ලබාගත හැකි බවත් මෙහිදී ගරු සභාවට පවසා සිටින ලදී.මෙම යෝජනා සියල්ල ගරු සභාපතිතුමා විසින් ස්ථිර කිරීමෙන් ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

### *04:12 ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා*

04:12:01 වතුකාරගොඩ ඇළ මාර්ගය ඉතිරි කොටස පැතිබැම්ම ඉදිකිරීම

04:12:02 වැකුඹුර ගමට පානීය ජලය ලබාදීම

04:12:03 වතුකාරගොඩ ග්‍රාමයේ ඉතිරි කොටසට පානීය ජලය ලබාදීම

04:12:04 බෝම්බුව ආචාරිමලේ දෙවන පටුමගේ කාණු පද්ධතිය සකස් කිරීම

04:12:05 බෝම්බුව ආචාරිමලේ දෙවන පටුමගේ මාර්ගය කොන්ක්‍රීට් යොදා සකස් කිරීම

04:12:06 බෝම්බුව මිරිස්කොටුව මාර්ගය කොන්ක්‍රීට් හෝ තාර යොදා සංවර්ධනය කිරීම

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ඉටුකර දෙන ලෙසත් එහිදී වතුකාරගොඩ ඇළ මාර්ගය ඉතිරි කොටස පැතිබැම්ම ඉදිකිරීම හා වැකුඹුර ගමට පානීය ජලය ලබාදීම යන යෝජනා සඳහා කඩිනම් විසඳුමක් අවශ්‍ය වී ඇති බැවින් ඒ සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන ලෙසත් මෙහිදී ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

### *04:13 ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය*

04:13:01 හුණුකුඹුර බළන්ගොඩ ගෙදර සිට බෝම්බුවට යන මාර්ගයේ ගඟ හරහා සකස් කිරීමට නියමිත පාලම ඉදිකිරීම

04:13:02 හුණුකුඹුර දෙල්ගස්වත්ත බළන්ගොඩ ගෙදර මාර්ගයට අවශ්‍ය ජල සැපයුම ලබාදීම

04:13:03 හුණුකුඹුර සුදර්ශන ගම මාර්ගයේ දෙපස කාණු පද්ධතිය සකස් කිරීම

මෙහිදී අදස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය ඉහත ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් යෝජනා කර ඇති සුදර්ශනගම යෝජිත ප්‍රජාශාලාව ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබාගැනීම තම අපේක්ෂාවක් වී තිබූ බවත් ඒ සඳහා දෙදෙනාම දායක වී ක්‍රියාකරමුයි පවසා සිටි අතර ඉතා අත්‍යවශ්‍ය යෝජනා 2 ක් වන හුණුකුඹුර බළන්ගොඩ ගෙදර සිට බෝම්බුවට යන මාර්ගයේ ගඟ හරහා සකස් කිරීමට නියමිත පාලම ඉදිකිරීම හා හුණුකුඹුර දෙල්ගස්වත්ත බළන්ගොඩ ගෙදර මාර්ගයට අවශ්‍ය ජල සැපයුම ලබාදීම යන යෝජනා 2 ඉතා කඩිනමින් ඉටුකිරීමට කටයුතු සිදුකරන මෙන් ඉල්ලා සිටින ලදී. මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

***04:14 ගරු නාගරික මන්ත්‍රිනී එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය***

04:14:01 කරව්කැටිය තුන්වන පටුමග ආරම්භ කොටස සිට ලසන්ත මහතාගේ නිවස දක්වා යන මාර්ගය හා කාණු පද්ධතිය සකස් කිරීම

04:14:02 කුමාරගම බටුගෙදරවත්ත මාර්ගය සංවර්ධනය කිරීම

04:14:03 කුමාරගම මූකලන්වත්ත මාර්ගය සංවර්ධනය කිරීම

04:14:04 කුමාරගම කනත්ත මාර්ගය සංවර්ධනය කිරීම

04:14:05 පල්ලෙකුඹුර මාර්ගය සංවර්ධනය කිරීම

04:14:06 කුමාරගම රත්නපාල මහතාගේ නිවස දක්වා යන මාර්ගය සංවර්ධනය කිරීම

04:14:07 නිවාස හා වැසිකිළි තැනීම සඳහා ආධාර ලබාදීම

ගරු නාගරික මන්ත්‍රිනි එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අතරින් පල්ලෙකුඹුර මාර්ගය සංවර්ධනය කිරීම යන යෝජනාව සඳහා කඩිනම් විසඳුමක් අවශ්‍ය වී ඇති බවත් මාර්ගය ස්ථාන 2ත් මේ වන විටත් ගිලා බැසීමේ අවදානමකට ගොදුරු වී ඇති බැවින් ඒ සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන ලෙසත්, මන්ත්‍රි ප්‍රතිපාදන යටතේ ලැබෙන ඉතිරි මුදලින් අඩු ආදායම් ලාභී පවුල් සඳහා නිවාස හා වැසිකිළි තැනීම සඳහා ආධාර ලබාදීම සිදු කරන මෙන් මෙහිදී ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රි කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

***04:15 ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා***

04:15:01 වැවේවත්ත උද්‍යානයේ නිවාස යෝජනා ක්‍රමය සඳහා විධිමත් කාණු පද්ධතියක් සැකසීම

04:15:02 බුලත්ගම ඇස්ඇද්දුම මාර්ගයේ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම.

ඉහත දක්වා ඇති යෝජනා අතරින් වැවේවත්ත උද්‍යානයේ නිවාස යෝජනා ක්‍රමය සඳහා විධිමත් කාණු පද්ධතියක් සැකසීම යන යෝජනාවට ප්‍රමුඛස්ථානයක් ලබාදෙන ලෙසත් බුලත්ගම ඇස්ඇද්දුම මාර්ගයේ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමද කඩිනමින් සිදුකරදෙන ලෙසත් මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා විසින් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05. පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ පිළිබඳ සභාව දැනුවත් කිරීම**

පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ පිළිබඳ සභාව දැනුවත් කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් විසින් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලදී.එහිදී මේ පිළිබඳ නිළධාරින් විසින් පැහැදිලි කර දුන් කරුණු පදනම් කරගෙන පළාත් ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ පිළිබඳ සභාවේ සභික පිරිස දැනුවත් වීම අවශ්‍ය බැවින් අවශ්‍ය විටෙක නිළධාරින්ගේ සහය ලබාගෙන එම ලේඛන පිළිබඳ අධ්‍යයනය කිරීමට හැකියාව ඇති බව පැවසු ගරු සභාපතිතුමා විසින් එතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභා අවස්ථාව මහසභාවක් බවට පත්කරන ලදී.

## 06. වෙනත් කරුණු

***ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා***

මෙහිදී අදහස් ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා ,තමන්ව වටිනා ඡන්දයෙන් තෝරා පත්කර ගත් කොට්ඨාශයේ ජනතාවට මුලින්ම ස්තුතිවන්ත වන බවත් උගත් හා පළපුරුදු පිරිසගේ දැනුම ලබාගෙන මෙසේ යන ගමනේ බලංගොඩ නගර සභා නාමය දියුණු කිරීමටත් , ජනතාවට උපරිම සේවය ලබාදීමට අපේක්ෂා කරන බවත් පවසා සිටි අතර බලංගොඩ නගරයේ නීතී විරෝධි මත්ද්‍රව්‍යය අළෙවි වීම වැඩිවෙමින් පවතින බැවින් සභාව මැදිහත්වී එය නතර කිරීම සඳහා අවශ්‍යය කටයුතු සිදුකිරිම සුදුසු බව මෙහිදී පවසා සිටින ලදී.

***ගරු නාගරික මන්ත්‍රී කේ. පී. ප්‍රේමදාස මැතිතුමා***

මෙහිදී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී කේ. පී. ප්‍රේමදාස මැතිතුමා සංවර්ධනය නොකල ඉඩම් හේතුවෙන් මැසි මදුරු උවදුර වැඩි වී ඇති බවත් පනතේ 165 වගන්තිය අනුව සංවර්ධනය නොකල හෝ ස්ථිර වගාවක් නොමැති හෝ හිස් ඉඩම්වලින් 2% ක බද්දක් අයකර ගැනීමට සභාවට බලය ඇතිබවත් පෙන්වා දෙන ලදී.

එමෙන්ම ගවයන් විශාල ප්‍රමාණයක් නගරය පුරා අයාලේ යන බැවින් සාමාන්‍ය ජන ජීවිතයට විශාල බාධාවක් වී ඇති බවත්, වාහන අනතුරු සිදුවීමට හේතුසාධකයක් වී ඇති බවත්,කිසිදු වගාවක් ක්‍රමවත්ව කරගෙන යාමට නොදෙන,ජන ජීවිතයට බාධාකාරි ලෙස හැසිරෙන දඩුලේනුන්,වඳුරන්,ඌරන් වැනි සතුන්ගෙන් වන හානිය වැළැක්වීම පිළිබඳ සභාවේ අවධානය යොමුකරන ලෙසත් මෙහිදී පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පති මැතිතුමා**

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පති මැතිතුමා ළදරු උයන ළඟ සිට ලංකා බැංකුව අසළට ගඟ අයින දිගේ ඇවිදීම සඳහා පාරක් සෑදිමට සභාවේ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටි අතර එය නගර වැසියන්ට හා ක්‍රීඩාංගනයට පැමිණෙන ක්‍රීඩකයන්ට ඉතා වැදගත් වන බන පවසා සිටින ලදී. එමෙන්ම සභාව විසින් ඉදිරියේදි සිදුකරන සෑම යහපත් කටයුත්තකටම පූර්ණ සහය ලබාදෙන බවත් සභාවේ ඉදිරි කටයුතු සාර්ථක වේවායි ප්‍රර්ථනා කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

බලංගොඩ නගර සභාවේ 19 වන සැසිවාරයෙ සභාව ඇමතීමට ලැබීම පිළිබඳ සතුටුවන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා තම ජයග්‍රහණය වෙනුවෙන් කැප වූ දෙහිගස්තලාව වසමේ මුස්ලිම් ජනතාවට මෙන්ම ද්‍රවිඩ හා සිංහල ජනතාවට ස්තුතිවන්ත වන බව පැවසු අතර එම ජයග්‍රහණය සඳහා සම්පූර්ණ සහයෝගය ලබාදුන් ගරු අධිකරණ ඇමතිනී තළතා අතුකෝරාළ මැතිතුමියට ස්තුතිවන්ත වන බව පවසා සිටින ලදී.

ලංකාවේ හොඳම නගර සභාව ලෙස අනෙකුත් පළාත් පාලන ආයතනවලට වඩා ඉහළ තත්වයකට බලංගොඩ නගර සභාව ගෙනා මෙහි කාර්යය මණ්ඩලයට විශේෂයෙන් ස්තුතිවන්ත වන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අනෙකුත් නගර මෙන් නොව බලංගොඩ නගරය විශේෂ නගරයක් බවත් බෞද්ධ භික්ෂූන් වහන්සේ ප්‍රමුඛ සිංහල

ජනතාවත්,බලංගොඩ වෙළෙඳ සංගමය හා සිංහ සමාජය මුස්ලිම් ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් පීඩාකාරි අවස්ථාවලදී පෙනී සිටින බවත් ඒ සඳහා විශේෂ ස්තුතිය පිරිනමන බවත් පවසා සිටින ලදී.

වැඩිදුරටත් අදහස් දක්වමින් බදු ගෙවන ජනතාවගේ ඡන්දයෙන් තේරි පත්වූ මහජන නියෝජිතයන් ලෙස ඔවුනට සේවය කිරීමට ඇප කැපවී ක්‍රියාකරමුයි පවසමින් කථාව නිමාකරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් අදහස් දක්වමින් පවතින මැතිවරණ ක්‍රමය අනුව ජනතා පරමාධිපත්‍යයට ඉඩක් නොමැති බවත් අනෙකුත් ජාතින් එක්ව ක්‍රියාකරන විට සිංහළ ජාතිය බෙදී කටයුතු කිරීම ශෝචනීය තත්වයක් බවත් පවසා සිටියේය.

1997 නගර සැළැස්ම නිර්මාණය කරමින් එවකට සිටි සභාපති ලෙස බලංගොඩ නගර සභාව ලංකාවේ ප්‍රථම ස්ථානය දක්වා ගමන් කිරීමට විශාල කැපකිරීමක් කල බවත් ඒ කිසි විටෙක මන්ත්‍රිවරුන්ගේ අනන්‍යතාවයට අත නොතැබූ බවත් ඉදිරියේදි පක්ෂයක් ලෙස එකතුවී ගමනක් යාමට නොහැකි වුවහොත් ස්වාධීන මන්ත්‍රිවරයෙක් ලෙස පෙනිසිටීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.

රු.10,000.00 ට වැඩි ගෙවීම් මුදල් කමිටුවේ නිර්දේශය මත රු.500,000 දක්වා වියදම් කිරීමට සභාපතිට බලය ලබාදීම පිළිබඳ විරුද්ධතාවය දක්වන බවත් රු.400,000 මන්ත්‍රි ප්‍රතිපාදන මගින් නිවාස ආධාර ලබාදීමට අපේක්ෂා කරන බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා මාධ්‍යවේදි දීමනාව ලබාදීම පිළිබඳ ඉදිරියේදි එක් නිගමනයකට පැමිණ එය මාධ්‍යවේදින්ට ලබාදීමට කටයුතු කිරීම සුදුසු බව පවසා සිටි අතර සභාවේ සෑම හොඳ කටයුත්තක් සඳහාම සහය ලබදෙන බවත්,නගරය දියුණුවට සෑම දෙනාම එක්ව කටයුතු කරමුයි පවසා සිටින ලදී.

වැඩි දුරටත් අදහස් දක්වමින් ඉරිදා පොලේ බිත්තර විකිනීම බහුල වී ඇති බවත්,ඉර එළියට නිරාවරණය වූ බිත්තර ආහාරයට ගැනීම සෞඛ්‍යයට අහිතකර බැවින් සියළු දෙනා ඒ පිළිබද දැනුවත් විය යුතු බවත් පවසා සිටි අතර අවසාන වශයෙන් සියළුම දෙනාගේ ජීවිත සැපවත් වේවායි පවසමින් අදහස් දැක්වීම නිමාකරන ලදී.

***<u>ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා</u>***

කේවළ හා අනුපාත ක්‍රමයට පැවති මෙම මැතිවරණ ක්‍රමයේ යම් යම් අඩුපාඩු තිබුනත් මෙම මැතිවරණ ක්‍රමය සාධනීය බවත්, කිසිදු පක්ෂයකට තනිව බලය පිහිටුවීමට ජනතා ප්‍රසාදය නොලද බවත් , පෙනුම හා හරය යන්න දෙකක් බවත් පවසමින් මන්ත්‍රි ආසන බෙදා ඇති ආකාරය පිළිබඳ දීර්ඝ විස්තරයක් සභාවට ඉදිරිපත් කල ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා තමන් ලද මන්ත්‍රි ධූරය ආභරණයක් සේ නොව වගකීමක් සේ සළකා ක්‍රියාකරන බවත් එය තම පක්ෂයේ ප්‍රතිපත්තිය බවත් පවසා සිටින ලදී.

***<u>ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා</u>***

මෙම මැතිවරණයේදි කිසිවෙකු ජයග්‍රහණය හෝ පරාජය නොකල බවත් කොට්ඨාශයේ තම පක්ෂයේ වැඩිම ඡන්ද ප්‍රමාණයක් ගනිමින් ජයග්‍රහණය කර සභාවට පැමිණි බවත් විවේචන හා

අභියෝග කුඩාකල සිට හුරු බවත් ඒ හමුවේ කිසිදා නොසැළෙන බවත් පැවසූ ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා බලංගොඩ ජනතාවගේ අපේක්ෂා ඉටුකිරීම සඳහා මම යන හැඟීමෙන් නොව අපි යන හැඟීමෙන් සියළු පක්ෂ එක්වී ගමනක් යෑමට එක්වෙමුයි පවසා සිටින ලදී.

එමෙන්ම තමා මේ තැනට ඔසවා තැබූ කොට්ඨාශයේ ආදරණීය ජනතාව,පන්සල,පල්ලිය,පාසල සහ පවුලේ සියළු දෙනාට විශේෂ ස්තුතිය පිරිනමන බව පැවසූ ගරු උප සභාපතිතුමා බලංගොඩ නගරයේ ජනතාවට හා බලංගොඩ නගරය සංවර්ධනයට එකසිතින් ඇපකැප වෙමුයි පවසා සිටින ලදී.

***<u>ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා</u>***

1991 වර්ෂයේ සිට මහජන නියෝජිතයෙක් වශයෙන් පත් වී හැකි උපරිම සේවය නගර සභාව වෙත ලබාදුන් බවත් මෙවරත් තමන් පිළිබඳ විශ්වාසය තබා වැඩි ඡන්ද ප්‍රමාණයකින් ජයග්‍රහණය ලබා දුන් කිරිදිගල ජනතාවටත්, බලංගොඩ නගරයෙ කොට්ඨාශ 7ක් ජයග්‍රහණය කිරීම සඳහා මෙහෙයවූ ගරු පළාත් සභා මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමාට හා හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ සියළුදෙනාට විශේෂයෙන් ස්තුතිවන්ත වන බව පවසා සිටින ලදී.එමෙන්ම අළුතින් පිහිටවූ පක්ෂයක් ලෙස වසර එකහමාරක් වැනි සුළු කාලයක් තුළ බලය පිහිටුවීමට හැකියාව ලද එකම පක්ෂයේ නියෝජිතයෙක් වීම සම්බන්ධයෙන් ඉතාමත් සතුටුවන බවද ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් පවසා සිටින ලදී.

නගර සභාව මගින් පෙර වසරවලදී ක්‍රියාත්මක කල විශ්ව විද්‍යාල සඳහා තේරි පත්වූ සිසුන්ට ශිෂ්‍යත්ව පිරිනැමීමේ මහගු වැඩසටහන නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා ගරු සභාපතිතුමා ඇතුළු සභාවට සෑම යහපත් කටයුත්තකදීම සහය දක්වන බවත් පවසා සිටි අතර සැමට සුභ අනාගතයක් පතමින් අදහස් දැක්වීම නිමා කරන ලදී.

***<u>ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා</u>***

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් බලංගොඩ නගර සභාවේ කොට්ඨාශ 10න් 7 ක් ජයග්‍රහණය කල බැවින් ජනතා අපේක්ෂාව වූයේ තමන් නියෝජනය කරන ලද එම පක්ෂයට නායකත්වය ලැබිය යුතු බවත් මන්ත්‍රී වරප්‍රසාද සැමට සම වුවත් තමන් ඇතුළු කණ්ඩායම සභාවට පැමිණි නියම ජනතා ප්‍රසාදය අනුව බවත් පවසා සිටි අතර මන්ත්‍රී දීමනා ලෙස මාසිකව රු.440,000 ක් වැනි විශාල මහජන මුදලක් සභාවට වැය කල යුතු බවත් එයට සාපේක්ෂව එම ජනතාවට සංවර්ධනය සිදුකිරීම සභාවේ වගකීම හා යුතුකම බවත් පෙන්වා දෙන ලදී.

එමෙන්ම වෙනත් කරුණු ඔස්සේ අදහස් දැක්වීම සඳහා නියමිත කාලයක් වෙන් කිරීම සුදුසු බව ත් එසේ නොවූ කල අනවශ්‍ය කාලයක් වැය වන බවත් පැවසූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා ඉදිරියේදි සංවර්ධන යෝජනා සඳහා මුදල් ප්‍රතිපාදන සපයා දෙන ලෙසත් ඉදිරියේදී එම යෝජනා ලිඛිතව ලබාදීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.නිවැරදි දේශපාලන තීන්දු තීරණ ඔස්සේ දේශපාලන න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කිරීමට තමන් සභාව කරා තෝරා පත්කර එවූ සියළු ජනතාවට හෘදයාංගම ස්තුතිය පිරිනමන අතර සභාවේ කාර්යය මණ්ඩලය හා මාධ්‍යවේදින්ට ගෞරවණීය ස්තුතිය පිරිනමන බවත් සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා සභාපතිතුමා ඇතුළු කාර්යය මණ්ඩලයට ශක්තිය ලබාදෙන බවත් පවසමින් අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

***ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා***

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් බලංගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ ක්‍රීඩකයන්ට ක්‍රීඩා කිරීමට අපහසු තත්වයට වලවල් සෑදි ඇති නිසා කඩිනමින් එය පිලිසකර කර දෙන මෙන් ඉල්ලා සිටි අතර තව දුරටත් අදහස් දක්වමින් බලංගොඩ නගරයේ කොට්ඨාශ 7ක් ජයග්‍රහණය කිරීම සඳහා මෙහෙයවූ ගරු පළාත් සභා මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමාට හා හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු පක්ෂයේ සියළුදෙනාට ගෞරවණීය ස්තුතිය පුදකරන බවත් වටිනා ඡන්දය භාවිතා කරමින් සභාව වෙත පත්කර එවූ කොට්ඨාශයේ ජනතාවට දිවිහිමියෙන් සේවය කිරීමට ඇප කැපවී සිටින බවත් එකම සිතින් එක අයුරින් පක්ෂ භේද නොතකා ජනතා සේවයට කැප වෙමුයි පවසා අදහස් දැක්වීම නිමා කරන ලදී.

***ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා***

ගරු සභාපතිතුමාට හා ගරු උප සභාපතිතුමාට සුභ පතමින් කථාව ආරම්භ කල ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා ජයග්‍රහණය කරන ලද පක්ෂයට පාලන බලය හිමිනොවූ විකෘති ඡන්ද ක්‍රමය පිළිබඳ අප්‍රසාදය පළකිරීමට ලෙස අවස්ථාවක් කරගන්නා බව පවසා සිටින ලදී.

පාට පක්ෂ භේද නොසළකා තම පක්ෂයේ නියෝජිතයන් කෙරෙහි විශ්වාසය තබමින් ඉදිරි වැඩ කටයුතු සඳහා සහභාගි කරගන්නා ලෙසත්, ඡන්දය ලබාදුන් ජනතාව සඳහා සේවය කිරීමට අවැසි සහයෝගය ලබාදෙන ලෙසත් මෙහිදී ඉල්ලා සිටින ලදී.

***ගරු නාගරික මන්ත්‍රිනී එම්. පී. ශාන්තිලේඛා මැතිතුමිය***

මෙහිදී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රිනී එම්. පී. ශාන්තිලේඛා මැතිතුමිය දේශපාලන ක්ෂේත්‍රය පිළිබඳ පරිනත භාවයකින් තොර වූවද කිසිවිටෙක කිසිවෙකුගේ බලපෑමකට හෝ බැඳීමකට යටත්ව තීරණ නොගත් බවත් පක්ෂ 2 ක සම්මුතියකින් සෑදි මෙම පක්ෂයේ විනිවිද භාවයෙන් යුතු යහපත් තීරණ සඳහා නිරන්තරයෙන් සහයෝගය දෙන බවත් පවසා සිටි අතර ඉදිරි වර්ෂ 4 තුළ උපරිම ශක්ති ප්‍රමාණයෙන් ජනතා සේවයට කැපවී ක්‍රියාකරන බවත් පවසා සිටින ලදී.

***ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය***

පක්ෂය ජයග්‍රහණය කරා මෙහෙයවූ සියළු දෙනාට විශේෂයෙන් ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බය පැවසූ ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය පක්ෂ භේද නොසළකා සභාපතිතුමාගේ සහයෝගය අපේක්ෂා කරන බවත් හුනුකුඹුර කොට්ඨාශයට බලවත් ගැටළුවක් වී තිබෙන ජලය සපයා ගැනීමේ ගැටළුවට කඩිනම් විසඳුම් අවශ්‍ය වී ඇති බවත් පවසා සිටි අතර සභාවේ ඉදිරි වැඩකටයුතු සඳහා පූර්ණ සහයෝගය ලබාදෙන බවත් පවසමින් සැමට සෞභාග්‍යමත් ජීවිතයක් පතමින් අදහස් දැක්වීම නිමා කරන ලදී.

***ගරු නාගරික මන්ත්‍රිනි එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය***

තම පියාගේ අභිප්‍රාය පරිදි දේශපාලනයට ආ ගමන පිළිබඳ සතුටු වන බවත් මෙය සුදුසුකම් සහිත ජනතා තෝරාගැනීම මත පැමිණි ගමනක් බවත් පැවසූ ගරු නාගරික මන්ත්‍රිනි

එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය මෙහිදී දේශපාලනයේ පරිනත පුද්ගලයන්ගේ සහය ආපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.තව දුරටත් අදහස් දක්වමින් සභාවක් නොමැති අවු.දෙක හමාරක කාලය තුළ නගර සභා සුළු සේවකයන් සහ කාර්යය මණ්ඩලය සිදුකරන ලද අගනා සේවයට ඇගයීමක් සිදුකිරීම කලයුතු බව පැවසූ ගරු නාගරික මන්ත්‍රිනි එම්.එස්.ඩී.වීරසිංහ මැතිතුමිය ඉදිරියේදි පක්ෂයේ තීන්දු තීරණ ඔස්සේ කටයුතු කරමින් බලගොඩ නගරය දියුණු කිරීමට කැපවෙමින් සහයෝගය ලබාදෙන බව පවසා සිටින ලදී.

07. **අවසානය**

මෙහිදී අදහස් දක්වූ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා තමා මෙවැනි තත්වයකට ඔසවා තැබූ තම පියාගේ දේශපාලනික සද්භාවයත්,තම මවගේ ආශිර්වාදයත්,පවුලේ සියළු දෙනාගෙන් ලද සහයෝගයත්,ඡන්දය ලබාදුන් කොට්ඨාශයේ ආදරණීය ජනතාවත්, මහා සංඝරත්නය සහ අන්‍යාගමික පූජකතුමන්ලාගෙන් ලද ආශිර්වාදයත්,සහය ලබාදුන් සියළු ඥාති හිත මිත්‍රාදින් ඇතුළු සියළු දෙනා සෙනෙහසින් සිහිපත් කරන බව පවසා සිටින ලදී.

එමෙන්ම ඉදිරියේදි පාට පක්ෂ භේදයකින් තොරව සියළුදෙනා අතර සම්පත් බෙදාහදා ගනිමින් සහයෝගයෙන් යුතුව නගරයේ තිරසාර සංවර්ධනය උදෙසා කටයුතු කිරීමට අපේක්ෂා කරන බවත් බලංගොඩ නගර සභා නාමය රන් අකුරින් ලියැවීමට සැවොම එක් වී ක්‍රියාකරමුයි පවසා සිටිමින් ප.ව. 3 .30 ට පමණ මෙදින මහ සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.